හරි දැක්මේ වසර 2005 - පියවර දෙකක් පෙරට

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
## ප්‍රධාන කාර්යාලය

අපේ අංකය :- සං / ප්‍රති / 01
චක්‍රලේඛ අංක 61

2005 / 05 / 30 දින,

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත,

**තේ නැවත වගා අවසර පත්‍ර සඳහා ආයුධ කට්ටලයක් සැපයීම.**

වාර්ෂික තේ නැවත වගා අවසර පත්‍ර යටතේ එක් එක් වර්ෂයක තේ නැවත වගාව වෙනුවෙන් නිකුත් කරනු ලබන අවසර පත්‍ර සඳහා එම වර්ෂය ඇතුලතම පස සාරවත් කිරීම සඳහා තෘණ සිටුවා අවසන් කරනු ලබන්නේ නම් ඒ සඳහා දිරිගැන්වීමක් වශයෙන් රුපියල් 1000/- කට නොවැඩි මුදලකට ආයුධ කට්ටලයක් සැපයීම සඳහා සං. ව. ආ. ප්‍රති (III) හා 1999 / 09 / 20 දිනැති ලිපිය පරිදි අනුමත කර තිබේ. මෙම දිරිගැන්වීම තුලින් අදාල වර්ෂය තුල නිකුත් කෙරෙන නැවත වගා අවසර පත්‍ර යටතේ තෘණ සිටුවන අවසර පත්‍ර සංඛ්‍යාව සහ එම බිම් ප්‍රමානය වැඩිවී ඇති අතර ඒ අනුව නියමිත කාලය තුල තේ පැල සිටුවන අවසර පත්‍ර සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණයද වැඩිවී තිබේ.

තේ නැවත වගා අවසර පත්‍ර යටතේ ඉහත පරිදි කටයුතු කිරීමේදී කිසියම් අවසර පත්‍ර හිමිකරුවෙකු වෙත එකම ඉඩමක් වෙනුවෙන් කලින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ ආයුධ කට්ටලයක් සපයා ඇති විටක නැවත නිකුත් කෙරෙන අවසර පත්‍රයක් වෙනුවෙන් ආයුධ කට්ටල නිකුත් නොකිරීමට යථෝක්ත ලිපිය මගින් උපදෙස් දී ඇත. එසේ වුවද අවසර පත්‍රවල ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම උදෙසා එම තීරණය නැවත සංශෝධනය කරනු ලබන අතර, ඒ අනුව එකම ඉඩමක වුවද අවුරුදු පතා අවසර පත්‍ර ලබාගෙන වගා කටයුතු නිසි ලෙස සිදුකරන්නේ නම් එම එක් එක් වර්ෂය තුල නිකුත් කරනු ලබන අවසර පත්‍ර සඳහා යථෝක්ත ලිපියේ සඳහන් අනෙකුත් කොන්දේසිවලට අනුකුලව ආයුධ කට්ටල ලබාදීම අනුමත කරමි.

ඒ අනුව යථෝක්ත ලිපියේ හයවැනි ජේදය ඉහත පරිදි නැවත සංශෝධනය කරනු ලබන බැව් මෙයින් දැනුම් දෙමි.

තවද මෙම ආයුධ කට්ටල මිලදී ගැනීමේදී මින් ඉදිරියට ප්‍රධාන කාර්යාලය මගින් කටයුතු කරන අතර ඔබගේ අවශ්‍යතාවයන් වර්ෂයකට එක්වරක් එනම් ජනවාරි මස 31 දිනට ප්‍රථම මෙම කාර්යාලයට දැනුම් දිය යුතුය. එහිදී ප්‍රධාන කාර්යාලයෙන් මිළදී ගැනීමට කටයුතු නොකරන භාණ්ඩ ඇත්නම් සාමාන්‍යාධිකාරී සමග සාකච්ඡා කොට එම ලිඛිත අනුමැතිය යටතේ මුල්‍ය රෙගුලාසිවලට යටත්ව ඔබ කාර්යාලය මගින් අදාල මිලදී ගැනීම සිදුකල හැකි බැව්ද දන්වා සිටිමි.

එසේ සපයන ආයුධ කට්ටල ඔවුන්ගේ වගා කටයුතු වලට දිරි ගැන්වීමක් ලැබෙන පරිදි සහ අනෙකුත් අවසර පත්‍ර හිමියන් ආකර්ශනය වන පරිදි කඩිනමින් බෙදා දිමට කටයුතු කළ යුතු බැව්ද වැඩි දුරටත් දන්වා සිටිමි.

ටිකිරි කොබ්බෑකඩුව
සභාපති.

පිටපත් :-

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( සංවර්ධන / ව්‍යාප්ති )
2. සහකාර සාමාන්‍යාධිකාරී ( පාලන / සේවා )
3. මුදල් කළමණාකාරු
4. අභ්‍යන්තර විගණක
5. කෘෂි අර්ථ ශාස්ත්‍රඥ
6. සහකාර දත්ත සැකසුම් කළමනාකරු